# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1986 අංක 18 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 ජූලි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 ජූලි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි    තැපැල් ගාස්තුව : ශත 75 යි

## 1986 අංක 18 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 ජූලි මස 24 වන දින.]

එල්. ඩී.—ඕ. 6/86.

**1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 18 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතේ 42ඒ වගන්තියේ (2ඇ) උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 1981 අංක 39 දරන පනතේ 42ඒ වගන්තිය සංශෝධනය කිරීම.

> "(2ඇ) (i) යම් පොදු සමාගමක් වෙත, (2) වන උපවගන්තියේ හෝ (2අ) වන උපවගන්තියේ හෝ (2ආ) වන උපවගන්තියේ හෝ විධිවිධාන අනුව ආගණනය කරන ලද යම් මුදලක් වන්දි වශයෙන් ලැබෙන අවස්ථාවක, සමාගම් ආඥාපනතෙහි හෝ වෙනත් යම් නීතියක හෝ කුමක් සඳහන් ව ඇත ද, සාධාරණ සහ සද්භාවයෙන් දරන්නට සිදු වූ බැරකම් හැටියට කොමිෂන් සභාව විසින් ඉඩ දෙනු ලබන එම සමාගමේ බැරකම් පියවීමෙන් පසුව, එම වන්දිය ලැබුණු දින සිට මාස හයක් ඇතුළත දී හෝ එම වන්දිය කොටස් වශයෙන් ලැබෙන විටෙක, එක් එක් කොටස ලැබී මාස හයක් ඇතුළත දී හෝ, එම වන්දිය, ඒ සමාගමේ කොටස් හිමියන් වෙත බෙදා දීම, ඒ සමාගමේ කාර්ය විය යුතු ය. මෙහි ඉහතින් විධිවිධාන සලසා ඇති පරිදි, කොමිෂන් සභාව විසින් ඉඩ දෙනු ලබන බැරකම් සඳහා වූ මුදල හැර, කිසිම අඩු කිරීමක් එවැනි යම් සමාගමක් විසින් ඒ වන්දි මුදලින් කරනු නොලැබිය යුතු ය.
>
> (ii) (i) වන උපවගන්තියෙහි සඳහන් එවැනි යම් සමාගමක කොටස් ප්‍රාග්ධනය විවිධ පන්තිවලට අයත් කොටස්වලට බෙදා තිබෙන අවස්ථාවක, වන්දි බෙදා හැරීම, එක් එක් කොටස් පන්තියට සම්බන්ධ අයිතිවාසිකම් අනුව කරනු ලැබිය යුතු ය.

2—ඒ 089497—6,900 (86/03)

(iii) (i) වන ඡේදයේ කාර්ය සඳහා "වන්දිය" යන යෙදුමට, එම වන්දිය මත ලැබිය යුතු ලෙස උපචිත වන යම් පොළියක් ඇතුළත් වන අතර, සමාගමකට අදාළව "බැරකම්" යන යෙදුමට, ව්‍යාපාරය නැතිවීම සම්බන්ධයෙන් යම් සමාගම කට හෝ ධුරය නැතිවීම සම්බන්ධයෙන් එවැනි යම් සමාගමක යම් අධ්‍යක්ෂවරයකුට, සේවා නියුක්තියකුට හෝ වෙනත් යම් සේවකයකුට ගෙවනු ලබන වන්දියක් හෝ වෙනත් යම් ගෙවීමක් හෝ ඇතුළත් නොවන්නේ ය.".

2 වන වගන්තිය අතීතයට බලපෑම.

3. මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, සියලු කාර්ය සඳහා, 1981 ජූනි මස 3 වන දින සිට බලාත්මක වූ ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව, වන්දිය යන යෙදුමට, ඒ වන්දිය මත ලැබිය යුතු ලෙස උපචිත වන යම් පොළියක් ඇතුළත් වන්නේ ද යන්න පිළිබඳව සහ ඒ වන්දියෙන් අඩු කළ හැකි බැරකම්වල ස්වභාවය පිළිබඳව යම් ප්‍රශ්නයක් යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක යම් අභියාචනයක දී, නඩුවක දී, ඉල්ලීමක දී හෝ වෙනත් නඩු කටයුත්තක දී (ඒ අභියාචනය, නඩුව, ඉල්ලීම හෝ නඩු කටයුත්ත ඉදිරිපත් කරන ලද්දේ හෝ පවරන ලද්දේ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව වුව ද පසුව වුව ද) උද්ගත වූ අවස්ථාවක, ඒ ප්‍රශ්නය හෝ කාරණය, මේ පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව තීරණය කළ යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ හැන්සාඩ්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 180 කි. (විදේශීය) රු. 200 කි, කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.